# ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සහ වියළි කලාපීය ප්‍රාග් ඓතිහාසික ස්ථානවලින් හමුවන බෙලිකටු අවශේෂ පිළිබඳ අධ්‍යයනයක්

## වත්සලා කරුණාරත්න[1]

දකුණු ආසියාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන හා ඒවායේ හමුවන අවශේෂ අතින් ශ්‍රී ලංකාවට ඉතා වැදගත් ස්ථානයක් හිමි වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන පිළිබඳව සිදු කොට ඇති පර්යේෂණ වලට අනුව පැහැදිලි වන ප්‍රධාන කරුණක් වන්නේ ප්‍රාග් ඓතිහාසික මානවයන් බෙල්ලන් ප්‍රධාන ආහාරයක් බවට පත්කරගෙන සිටි බවයි. විශේෂයෙන් ම තෙත් සහ වියළි කලාපීය ප්‍රාග් ඓතිහාසික ස්ථාන වලින් හමුවන බෙලි කටු අතර, කරදිය සහ මිරිදිය යන දෙවර්ගයේ ම බෙල්ලන් පිළිබඳව සාධක හමු වේ.

මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වන්නේ නැගෙනහිර පළාතේ මෙතෙක් සිදු කොට ඇති ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ වලට අනුව හමු වී ඇති බෙලි කටු අවශේෂ මොනවාද? ඒවා කුමක් සඳහා භාවිත කළේද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එමෙන් ම නැගෙනහිර පළාත තුළ දක්නට ලැබෙන ප්‍රාග් ඓතිහාසික ස්ථානවල දක්නට නොලැබෙන සාධක වියළි කලාපීය වෙනත් ස්ථානවල දක්නට ලැබේ නම් ඒ සඳහා බලපානු ලැබූ හේතු සාධක මොනවාද යන්නත් අධ්‍යයනය කිරීම මෙහිදී සිදු කරනු ලැබේ.

**ප්‍රමුඛ පද:** ප්‍රාග් ඉතිහාසය, මානවවිද්‍යාව, බෙල්ලෝ
**Title:** Pre- historic shell finds in Eastern Province and dry zone
**Keywords:** pre-history, anthropology, shell remains

[1] අජන්තා, විපුලඥාන මාවත, ඇහැලියගොඩ